# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,494 - 2007 අප්‍රේල් 20 වැනි සිකුරාදා - 2007.04.20

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 392 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 397 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 398 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 400 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 137

DIRF/RECT/86(VI)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව– ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත නම සඳහන් මහත්මිය 2004 අප්‍රේල් මස 30 වන දින සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ ලුතිතන් කර්නල් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය වෙත ඇතුළත් කිරීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

විශේෂඥ වෛද්‍ය නිලධාරිනී – ලුතිතන් කර්නල් ගීතිකා මුද්‍රානි ජයවීර (නි/67094)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,<br>ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,<br>නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,<br>කොළඹ දී ය.

04-350

---

2007 අංක 138

DIVF/RECT/49AV.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2005 ජුනි 25 වන දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට දක්වා ඇති රෙජිමේන්තු/බලකා වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමන් විසින් අනුමත කර ඇත.

(අ) කෙඩෙට් නිලධාරී - මහමුදලිගේ අමිල මයන්ත - ගැමුණු හේවා බළඇණිය (ස්වේච්ඡා)
(ආ) කෙඩෙට් නිලධාරී - හේවා වලිමුණිගේ වසන්ත රණසිංහ - සන්නද්ධ බුද්ධි බලකාය (ස්වේච්ඡා)
(ඇ) කෙඩෙට් නිලධාරී - අරුණ කිරින්ද හේවගේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඈ) කෙඩෙට් නිලධාරී - බමුණුසිංහ ආරච්චිලාගේ දොන් නුවන් දේශප්‍රිය සෙනෙවිරත්න ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ස්වේච්ඡා)
(ඉ) කෙඩෙට් නිලධාරී - එදිරිසූරිය මුදියාන්සේලාගේ වසන්ත සංජීව එදිරිසූරිය - ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඊ) කෙඩෙට් නිලධාරී - දම්පේවත්තේ ආරච්චිලාගේ නුවන් චූලා රූපසිංහ - විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(උ) කෙඩෙට් නිලධාරී - එදිරිසිංහ පේඩිගේ සුරේෂ් තරංග ජයසිංහ - ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(ඌ) කෙඩෙට් නිලධාරී - දොඹගහපතිරගේ කළණ ජයබුද්ධික පීරිස් - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(එ) කෙඩෙට් නිලධාරී - කුලතුංග මුදියාන්සේලාගේ ගැමුණු අමරනායක - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඒ) කෙඩෙට් නිලධාරී - ගනේගොඩගේ නයන කාන්ත ලක්මාල් කුමාර ගනේගොඩ - විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඔ) කෙඩෙට් නිලධාරී - හංගමුව මොහොට්ටි ගයාන් චාමිකර - ගැමුණු හේවා බළඇණිය (ස්වේච්ඡා)
(ඕ) කෙඩෙට් නිලධාරී - වැවල රණවකගේ බුද්ධික ප්‍රදීප් කුමාර රණවක - ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ක) කෙඩෙට් නිලධාරී - ජයලත් ආරච්චිලාගේ නන්දන රුවන් කුමාර හේරත් - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ග) කෙඩෙට් නිලධාරී - මෙවන් මංජු ශ්‍රී කන්දෙආරච්චි - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ස්වේච්ඡා)
(ජ) කෙඩෙට් නිලධාරී - විරද්දන විරාජ් සිවන්ත ද සිල්වා - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ච) කෙඩෙට් නිලධාරී - බොරළුවේ රත්නායක මුදියන්සේලාගේ නුවන් බංඩාර රත්නායක - ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(ට) කෙඩෙට් නිලධාරී - මිල්ලෙහේනේ ගෙදර අකලංක උදේෂ් මිල්ලෙහේනේ - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඩ) කෙඩෙට් නිලධාරී - නුවන් තිවංක නාවලගේ - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(න) කෙඩෙට් නිලධාරී - විජේකෝන් මුදියන්සේලාගේ ප්‍රමිත නාමල් බංඩාර හපුරාව - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ප) කෙඩෙට් නිලධාරී - ලොකු කංකානම්ගේ රොෂාන් කුලරත්න පීරිස් - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,<br>ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,<br>නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 08 වැනි දින,<br>කොළඹ දී ය.

04-349

---

2007 අංක 139

D/RF/824/NY/04/04.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2006 සැප්තැම්බර් මස 01 වන දින සිට රියර් අද්මිරාල් වශයෙන්.–*

කොමදෝරු පෙටහන්දි ලක්ෂ්මන් නානප්‍රසාද් ඔබේසිංහ, යූඑස්පී, පීඑස්සී – එන්ආර්එක්ස් – 0099

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

04-357

---

2007 අංක 140

D/22/NY/380.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිළධාරියා 2006 දෙසැම්බර් මස 07 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

රියර් අද්මිරාල් ලෙස්තුරුගේ දයානන්ද ධර්මප්‍රිය, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, – එන්ආර්එක්ස් 0056

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

04-353/1

---

2007 අංක 141

D/22/NY/380.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිළධාරියා 2006 දෙසැම්බර් මස 07 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

රියර් අද්මිරාල් ලෙස්තුරුගේ දයානන්ද ධර්මප්‍රිය, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, – එන්ආර්එක්ස් 0056

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

04-353/2

---

2007 අංක 142

D/RF/824/NY/03/02.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2006 ජූලි මස 01 වන දින සිට කපිතාන් (සිඉ) වශයෙන්.–*

කොමාණ්ඩර් (සිඉ) [තාවකාලික කපිතාන් (සිඉ)] යාපා මුදියන්සේලාගේ අජන්ත ගාමිණී යාපා, ශ්‍රීලංනාහ – එන්ආර්පී 0187

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

04-351

---

2007 අංක 143

D/RF/824/NY/03/02.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2006 ජනවාරි මස 01 වන දින සිට තාවකාලික කපිතාන් වශයෙන්.–*

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) නිරාජ පණ්ඩුල ශ්‍රීපති ආටිගල, ආර්එස්පී, පීඑස්සී – ශ්‍රීලංනාහ – එන්ආර්එක්ස් – 0256

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) සමරවීර මුදලිගේ දොන් කපිල සමරවීර, ආර්එස්පී – ශ්‍රීලංනාහ – එන්ආර්එක්ස් – 0254

කොමාණ්ඩර් (සංඥා) අගලවත්ත අශෝක ප්‍රින්ස්ලි ලියනගේ, ආර්එස්පී, පීඑස්එන් – ශ්‍රීලංනාහ – එන්ආර්එක්ස් 0341

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) ප්‍රියංක මෙරිල් වික්‍රමසිංහ, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී – ශ්‍රීලංනාහ – එන්ආර්එක්ස් 0260

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

04-356

---

2007 අංක 144

D/22/NY/377.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිළධාරියා 2006 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.–

කොමාණ්ඩර් (නාසෙ) මනමේන්ද්‍ර ආචරිගේ නිහාල් චන්ද්‍රසිරි, එන්ආර්පී 0379, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

04-361

---

2007 අංක 145

D/RF/832/NY.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ක්ෂේත්‍ර උසස් කිරීම්

*පහත නම සඳහන් නිලධාරියා 2006 මැයි මස 11 වන දින සිට කොමාණ්ඩර් (සීඩීඹ්) වශයෙන්.–*

ලුතිනන් (සීඩීඹ්) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සීඩීඹ්)] එදිරිප්පුලිගේ ලලිත් ප්‍රසන්න එදිරිසිංහ, එන්ආර්එක්ස් 0917 ශ්‍රීලංනාහ

*පහත නම සඳහන් නිලධාරියා 2006 මැයි මස 11 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්.–*

ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ දිනේෂ් හර්ෂජීව සම්පත් රත්නායක, එන්ආර්එක්ස් 1621 ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූනි මස 07 වැනි දින,
කොළඹ දී ය.

04-355

---

2007 අංක 146

D/22/NY/391.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2007 ජනවාරි මස 31 වැනි දින සිට කොමාණ්ඩර් වශයෙන් :–*

ලුතිනන් කොමාණ්ඩර් (තාවකාලික කොමාණ්ඩර්) තාවකාලික කොමාණ්ඩර් ගමගේ ආරච්චිගේ අජිත් උදයාන විජයසේකර, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලංනාහ, එන්ආර්එක්ස් 0265

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

04-362/2

---

2007 අංක 147

D/RF/751/RECT/NY/14.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ක්ෂේත්‍ර උසස් කිරීමක්

*පහත නම සඳහන් නිළධාරියා 2006 ජනවාරි මස 01 වන දින සිට තාවකාලික කොමාණ්ඩර් (එච්) වශයෙන් :-*

ලුතිනන් කොමාණ්ඩර් (එච්) අශෝක විජේසිරිවර්ධන, ශ්‍රීලංනාහ, එන්ආර්එක්ස් 0496

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුනි මස 07 වැනි දින,
කොළඹ.

04-366

---

2007 අංක 148

D/22/NY/391.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා නාවික හමුදා සේවය සඳහා වෛද්‍ය හේතූන් මත නුසුදුසු වීම නිසා 2007 පෙබරවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ස්ථිර බලකායේ විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

තාවකාලික කොමාණ්ඩර් ගමගේ ආරච්චිගේ අජිත් උදයාන විජයසේකර– ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලංනාහ – එන්ආර්එක්ස් – 0265

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ.

04-362/1

---

2007 අංක 149

D/22/NY/373.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 ජුලි මස 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

වෛද්‍ය ලුතිනන් නිශාන්ත පුෂ්පකුමාර අබේදිර, ශ්‍රීලංනාහ, එන්ආර්එම් 1324

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 16 වැනි දින,
කොළඹ.

04-352

---

2007 අංක 150

D/22/NY/375.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් හා නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 15 වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැනීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවය වෙත මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (නාසෙ) ගුණරත්නගේ සෙනරත් ජයවර්ධන, එන්ආර්පී 0989 ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුලි මස 31 වැනි දින,
කොළඹ.

04-358

---

2007 අංක 151

D/22/NY/382.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 සැප්තැම්බර් මස 25 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

උප ලුතිනන් තල්ගස් දුවගේ ප්‍රභාත් චන්දික, එන්ආර්එම් 1610, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ.

04-354

---

2007 අංක 152

D/VF/193/NY.

## ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්වේච්ඡා නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2006 ජනවාරි මස 01 වන දින සිට කපිතාන් (ස්වේච්ඡා )වශයෙන්.–*

කොමාණ්ඩර් (ස්වේච්ඡා) [තාවකාලික කපිතාන් (ස්වේච්ඡා)] විතාරනගේ ජයරත්න – එන්වීඑක්ස් 5035

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ.

04 – 365

---

2007 අංක 153

D/VF/219/NY.

## ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව

### ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2005 අගෝස්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්වේච්ඡා නාවික හමුදාවේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (ස්වේ) සාලිය කුමාර වීරසිංහ, ශ්‍රීලංනාස්වේහ, එන්වීඑක්ස් 5036

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ.

04-363

---

2007 අංක 154

D/VF/193/NY.

## ශ්‍රී ලංකා නාවික හමුදාව –ස්වේච්ඡා නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2006 පෙබරවාරි මස 17 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්.–*

ලුතිනන් බ්‍රැන්ඩි ගම්පලගේ ශ්‍රියාණි මංගලිකා පෙරේරා. එන්වීඑස් 5171 ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුලි මස 06 වැනි දින,
කොළඹ.

04-367

---

2007 අංක 155

D/VF/218/NY.

## ශ්‍රී ලංකා නාවික හමුදාව –ස්වේච්ඡා නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීමක්

2006 අගෝස්තු මස 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) ජෝශප් පෙරියතම්බි, ශ්‍රීලංස්වේනාහ, එන්වීඑක්ස් 5243

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 30 වැනි දින,
කොළඹ.

04-364

---

2007 අංක 156

D/VF/220/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව –ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

2006 සැප්තැම්බර් මස 21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) පොලියත්ත කුමාරගේ ධර්මදාස, ශ්‍රීලංස්වේනාහ. එන්වීඑක්ස් –5323

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ.

04-368

---

# වෙනත් පත්කිරීම් ආදිය

2007 අංක 157

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත් කිරීම්**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ ඒ. ආර්. ගුණවර්ධන මහතා 2006.08.31 දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ධීවර සමාජ සංවර්ධන වශයෙන්)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ බී. එම්. එස්. බණ්ඩාර මහත්මිය 2006.05.17 දින සිට නැවත නියමයන් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ඩබ්. යූ. පී. ප්‍රේමචන්ද්‍ර මහතා 2006.07.13 දින සිට නැවත නියමයන් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ඩී. එන්. වීරකෝන් මහත්මිය 2006.09.29 දින සිට නැවත නියමයක් කරන තුරු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා මණ්ඩලයේ සහ වාස්තු විද්‍යාඥ සේවා මණ්ඩලයේ ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පී. නාමගල් මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයන් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එන්. සිවලිංගම් මහතා 2004.09.01 දින සිට නැවත නියමයන් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ආර්. රුෂාන්දන් මහතා 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ යූ. ජී. ආර්. ආරියරත්න මහතා 2004.09.13 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ටී. එම්. ජේ. ඩබ්. තෙන්නකෝන් මහතා 2004.11.17 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. ඒ. එස්. ප්‍රනාන්දු මහතා 2005.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ බී. එන්. ලියනගේ මෙනවිය 2005.10.10 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂවරියක් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. ඩී. සී. ජානකී මහත්මිය 2006.02.16 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඩී. විදානගමාච්චි මහතා 2006.02.20 දින සිට නැවත නියමයක් කරන තුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කේ. වී. අතුල මහතා 2006.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කේ. එම්. බී. ටී. කරුණාසේන මහත්මිය 2006.04.03 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරියක් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. එම්. එම්. කේ. දයාරත්න මහත්මිය 2006.05.16 දින සිට නැවත නියමයන් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එස්. එම්. එස්. ඩී. ගුණසිංහ මහතා 2006.07.11 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කේ. ජී. විජේසිරි මහතා 2006.07.18 දින සිට නැවත නියමයක් කරන තුරු අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ජී. ජී. එස්. සී. රෝෂන් මහතා 2006.08.07 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. ඒ. එස්. ප්‍රනාන්දු මහතා 2006.08.08 දින සිට නැවත නියමයක් කරන තුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ජී. එම්. ජෝපියස් මහතා 2006.09.06 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරයෙක් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ සමන්ති රණසිංහ මහත්මිය, 2006.09.11 දින සිට නැවත නියමයක් කරන තුරු, අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පී. පී. එස්. ආර්. ද සිල්වා මහතා 2006.09.12 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ බී. එච්. එන්. ජයවික්‍රම මහතා 2006.10.30 දින සිට නැවත නියමයක් කරන තුරු ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඩී. ඒ. එල්. ඉලේපෙරුම මහත්මිය 2006.11.01 දින සිට නැවත නියමයක් කරන තුරු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 මාර්තු මස වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,කොළඹ 07.

04-309

---

# ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය : ඊඩී/1/8/2/කො/44.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, පිළියන්දල, හිරිමංගල වත්ත, උතුරුමාවියේ ශාන්ති විහාරස්ථානයේ පිහිටි කො/විද්‍යාශාන්ති මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය වැල්ලවත්තේ පඤ්ඤාසිරි ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේනොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-348/1

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/2/ගම්/මීනු/22

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, රද්දොළුව කොටුගොඩ, සුබෝධාරාම විහාරස්ථානයේ පිහිටි ගම්/මීනු/ශ්‍රී ධර්මානන්ද මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කිරීමෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය රද්දොළුවේ විමලවංශ ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේනොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-348/2

---

D/RF/555/RECT/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිරීක්ෂණ මුර නෞකාව අධිකාරියට පත් කිරීම

ශ්‍රී ලංකා නාවික හමුදාවට මෑතකදී පවරාගත් නිරීක්ෂණ මුර නෞකාව 2006 ජුනි මස 09 වැනි දින සිට පී 622 – ශ්‍රී ලංකා නාවික නෞකා සාගර වශයෙන් අධිකාරියට පත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුනි මස 08 වැනි දින,
කොළඹ.

04-359

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/කෑ/37

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, මොළගොඩ කුඹල්දිවෙල, ගලහණේ පුරාණ විහාරස්ථානයේ පිහිටි කෑ/ශ්‍රී සද්ධර්මෝදය මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරනමෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය හෙට්ටිමුල්ලේ සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-348/3

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/කෑ/38.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, පුනහැල, බුලත්කොහුපිටියේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ පිහිටි කෑ/ශ්‍රී දේවරක්ෂිත මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය බැද්දේවෙල සුමනසිරි ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර,
අධ්‍යාපන අමාත්‍යාංශයේ, "ඉසුරුපායේ",
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-348/4

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/මා/18

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, හදුන්ගමුව ග්‍රාමයෙහි, ශ්‍රී අභිනවාරාම විහාරස්ථානයේ පිහිටි මා/ශ්‍රී ඤාණිස්සර මූලික පිරිවෙන 2005.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය හඟුරන්කෙත පේමරතන ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-348/5

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/අම්/19.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය, නවමැදගම ශ්‍රී සද්ධර්මාරාම විහාරස්ථානයේ පිහිටි අම්/ශ්‍රී සද්ධර්මාරාම මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය හුරිකඩුවේ පවරකිත්ති ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04-348/6

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0100005455.

ණයකරුගේ සම්පූර්ණ නම : වැමුල්ලගේ ගාමිණී උදය රංජිත්.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. ජයරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1330 හා 2000.12.04 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත)) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑඅටයි ශත හැටහයක (රු. 1,30,678.66) ක මුදලක් වර්ෂ 2006.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ පහළොස් දහස් හයසිය තිස්හතයි ශත හතලිස්නමයක (රු. 1,15,637.49) මුදල ද, වර්ෂ 2006.01.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් පහළොස් දහස් හතලිස් එකයි ශත දාහතක් (රු. 15,041.17) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑඅටයි ශත හැටහයක (රු. 1,30,678.66) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ පහළොස් දහස් හයසිය තිස්හතයි ශත හතලිස්නමයක (රු. 1,15,637.49) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොලියක් 2006.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ, තලගල ග්‍රාමයෙහි පිහිටි කුඹුකේ එස්ටේට් නමැති ඉඩමට 1999.12.31 දින කේ. ඩී. ජී. වීරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1729 පිඹුර ප්‍රකාර ලොට් 102ට මායිම්, උතුරට : ලොට් 113 ද, නැගෙනහිරට : ලොට 115 ද, දකුණට : ලොට් 100 ද, බස්නාහිරට : ලොට් 101 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාසයයි දශම හතයි හයක (අ. 0, රූ. 0, පර්. 16.76) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරක දෙකයි හතරක (හෙක්. 0.0424) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමඟ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 185/248 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-395

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/00/01077 සහ 04/70/00/0719.

ණයකරුගේ සම්පූර්ණ නම : සුසන්ත කීර්ති කුමාර වීරසූරිය.

මහනුවර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. අබේසිංහ සහ එම්. ඩබ්. සෙනෙවිරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1254 සහ 8919 හා 1998.11.05 සහ 1997.11.22 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන)) පනතින් (සංශෝධිත)) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසි දෙදහස් හත්සිය හතරයි ශත දහහතරක(රු. 3,22.,704.14) ක මුදලක් වර්ෂ 2003.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් හයසිය හතලිස්එකයි ශත හැත්තෑහතක (රු. 2,52,641.77) මුදල ද, වර්ෂ 2003.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැත්තෑ දහස් හැටදෙකයි ශත තිස්හත (රු. 70,062.37) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසි දෙදහස් හත්සිය හතරයි ශත දහහතරක(රු. 3.22.704.14) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් හයසිය හතලිස්එකයි ශත හැත්තෑහතක (රු. 2,52,641.77) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% සහ 17.00% බැගින් වන පොලියක් 2003.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2003ක් වූ නොවැම්බර් මස 25 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලෙගම්පහ පත්තුවේ පාතදුම්බර කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාවේ නාරන්දන්ඩ ග්‍රාමයෙහි පිහිටි රාමචන්ද්‍ර වතුයාය, ගුරුකැටේහේන සහ හේනෙගෙදර වලව්ව වත්ත නමැති ඉඩමට 1996.01.05 දින එස්. විජේරත්න මානකතැන විසින් මැන සම්පාදිත අංක 3891 පිඹුර ප්‍රකාර ලොට් 215 ට මායිම්, උතුරට : ලොට් 217 සහ 216 ද, නැගෙනහිරට : ලොට් 216 සහ 214 ද, දකුණට : ලොට් 213, 214 සහ 338 (මාර්ග රක්ෂිතය) ද, බටහිරට : ලොට් 217 සහ 338 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම දෙකක් (අ. 0 රූ. 0 පර්. 13.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 649/85 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී නාරන්දන්ඩ ග්‍රාමයෙහි පිහිටි රාමචන්ද්‍ර වතුයාය, ගුරුකැටේහේන සහ හේනෙගෙදර වලව්ව වත්ත නමැති ඉඩමට 1996.01.05 දින එස්. විජේරත්න මානකතැන විසින් මැන සම්පාදිත අංක 3891 පිඹුර ප්‍රකාර ලොට් 216 ට මායිම්, උතුරට : ලොට් 217 සහ 338 (මාර්ග රක්ෂිතය) ද, නැගෙනහිරට : ලොට් 214 සහ 338 (මාර්ග රක්ෂිතය) ද, දකුණට : ලොට් 214 සහ 215 ද, බටහිරට : ලොට් 217 සහ 215 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහක (අ. 0 රූ. 0 පර්. 12.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 649/86 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

04-397

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියේ දැන්වීමයි

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව සම්මත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද වර්ෂ 2006ක් වූ ජනවාරි මස 23 වන දිනැති අංක 8972 දරන උකස් බැඳුම්කරය මගින්, මාතලේ, මහදේවල පාර, අංක 03 දරන ස්ථානයේ මයලාගු ෂෂිකරන් යන අය විසින් ලබා ගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි පිහිටි (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට මයලාගු ෂෂිකරන් යන අය විසින් පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් එක් මිලියන එක් ලක්ෂ තිස් හත් දහස් එකසිය තිහකුත් ශත හතලිස් දෙකක (රු.1,1,37,130.42) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, එකී රුපියල් එක් මිලියන එක් ලක්ෂ තිස් හත් දහස් එකසිය තිහකුත් සත හතලිස් දෙකක (රු.1,1,37,130.42) මුදල ද, වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 29 වන දින සිට විකිණීමේ දිනය දක්වා අයිරා ණය පහසුකම මත වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට හිඟව ඇති ප්‍රාග්ධන මුදල වන රුපියල් නවලක්ෂ තිස් දහස් හයසියයක (රු. 9,30,00) මුදලක් මත එක් වර්ෂයකට 20.53% ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොළිය ද වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 දින වන විට අයිරා පහසුකම මත හිඟව පවතින රුපියල් එක් ලක්ෂ හතලිස් පන් දහස් හාරසිය තිස් නවයකුත් ශත විසි තුනක (රු.1,45,439.23) මුදලක් මත එක් වර්ෂයකට 33% බැගින් ගණන් බලනු ලැබූ අනුප්‍රමාණයට මාසිකව වැල් පොලිය ද, සමග එයට අදාළ ව්‍යවස්ථාපිත ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩුකර පසු මුදල, අයකර ගැනීම සඳහා වත්තල, හැඳල, පල්ලිය වත්තේ, ප්‍රීතිපුර පාරේ අංක 247 හි බලයලත් වෙන්දේසිකරු ගාමිණී බී. එස්.දියාව විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ."

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට, ගංදහය කෝරළේ දකුණේ, බූටාවත්තේ පිහිටි, මහනුවර බලයලත් මිනින්දෝරු පී. ස්පෙන්සර් විසින් සාදන ලද වර්ෂ 1946ක්වූ ඔක්තෝබර් මස 2 වන දිනැති අංක 377/100 දරන පිඹුරේ ලොට් 3,4,5 සහ 6 වශයෙන් සලකුණු කොට දැක්වෙන නිකතැන්නවත්තේ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: හාතමුණේ වත්ත සහ රෙන්ගසාමිගේ වත්ත ද, නැගෙනහිරට : රෙංගසාමිපිල්ලෙයි ගේ වත්ත සහ වයියපුරි ඩිල්ලාට අයිති නිකතැන්න එගොඩ ඇල හේන ද දකුණට : ගල සහ එඬරු වැට සහ එල්. කිරි බණ්ඩාට අයිති ඉඩම ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 2 ද වන ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දහතුනක් (අක්කර 2 රූඩ් 3 පර්චස් 13) හෝ බලයලත් මිනින්දෝරු එස්. කැකුලාන්දර විසින් සාදන ලද වර්ෂ 1986 ක්වූ අගෝස්තු මස 20 වන දිනැති අංක 329 දරන මැනුම් පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහක් (අක්කර 2 රූඩ් 3 පර්චස් 30) වන ඉඩම් කොටස. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම /පත්ඉරු ජී. 424/92හි ලියාපදිංචි වී ඇත.

නැවත මැනීමක් කරනු ලැබ, බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර මහතා විසින් සාදන ලද අංක 329 සහ වර්ෂ 1986ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල ලෙස නිරූපිත එකී ඉඩම සහ පරිශ්‍රය, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට, ගන්දහය කෝරළේ නිකතැන්නෙහි පිහිටා ඇති බලයලත් මිනින්දෝරු පී. ස්පෙන්සර් විසින් සාදන ලද අංක 377/100 සහ වර්ෂ 1946ක් වූ පෙබරවාරි මස 4 වන සහ ඔක්තෝබර් මස 2 වන දින දරන පිඹුරේ කැබලි අංක 3,4,5 සහ 6 දරන නිකතැන්නවත්තේ බෙදා වෙන් කරන ලද කොටසක් වශයෙන් විස්තර කර ඇති අතර, එකී අංක 329 හා වර්ෂ 1986ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ සඳහන් එකී අංක 1 බිම් කැබැල්ල, ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහකින් (අක්කර 2 රූඩ් 3 පර්චස් 30) සමන්විත වේ. උතුරට : හාතමුණේ වත්ත ද,

නැගෙනහිරට : ඒ. විමලසූරිය හිමිකම් පාන ඉඩම, කරුපයියා සහ ජෝන් ගේ ඉඩම සහ ඩී. කේ. ජී. රත් බණ්ඩා ගේ ඉඩම ද, දකුණට : එල්. කිරිබණ්ඩා විසින් හිමිකම් පාන ඉඩම ද, බස්නාහිරට : අංක 377/100 දරන පිඹුරේ ලොට් 2 දරන ඉඩමේ ඉතිරි කොටස ද සහ එහි පිහිටි සියලුම දේ සමග වේ.

නැවත මැනීමක් කරනු ලැබ, බලයලත් මිනින්දෝරු එන්. ඩී. බී. වැත්තැව විසින් සාදන ලද අංක 3437 සහ වර්ෂ 2005ක් වූ මාර්තු මස 17 වන දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල ලෙස නිරූපිත එකී ඉඩම සහ පරිශ්‍රය, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට, ගන්දහය කෝරළය දකුණ, නිකතැන්නේ පිහිටා ඇති (බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර විසින් සාදන ලද අංක 329 හා වර්ෂ 1986ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල වශයෙන් නිරූපිත ඉඩම වන) නිකතැන්න වත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම වශයෙන් විස්තර කොට ඇති අතර, අංක 3437 දරන එකී පිඹුරේ අංක 1 බිම් කැබැල්ල වන එකී ඉඩම ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහකින්( අක්කර 2 රූඩ් 3 පර්චස් 30) සමන්විත වේ.

උතුරට : හාතමුණේ වත්ත සහ රෙන්ගසාමිගේ වත්ත ද, නැගෙනහිරට : ඒ. විමලසූරිය හිමිකම්පාන ඉඩම, කරුපයියා සහ වෙනත් අයගේ ඉඩම සහ ඩී. කේ. ජී. රත් බණ්ඩා සහ අනෙක් අයගේ ඉඩම ද, දකුණට : ප්‍රධාන පාරේ සිට ප්‍රවේශ මාර්ගය සහ කලින් කිරි බණ්ඩාගේ ඉඩම ද, බස්නාහිරට : ආරුමුගම් සහ වෙනත් අයට අයිති නිකතැන්න වත්ත සහ රාජරත්නම්ගේ නිකතැන්නේ වත්ත ද, සහ එහි පිහිටි සියලුම දේද සමග වේ

මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.

04-342/1

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මතියේ දැන්වීමය

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව සම්මත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ :

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද වර්ෂ 2002ක් වූ නොවැම්බර් මස 09 වන දිනැති අංක 8293 දරන උකස් බැඳුම්කරය මගින්, දෙදෙනාම, මහනුවර, පේරාදෙණිය පාර, අංක 524/1 හි පදිංචි "ක්‍රිස්ටල් ලංකා එන්ටර්ප්‍රයිසස් " යන නාමය, අභිධානය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාරයක් කරගෙන යන දැනට මහනුවර තැන්නේකුඹුර, හේවාහැට පාරේ අංක 89 දරන ස්ථානයේ මඳුවතී සමරසේකර විවාහයට පෙර ජයවික්‍රම සහ දුනුවිලගේ අනුර ජයවික්‍රම යන අයවලුන් විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි පිහිටි (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තවද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී මඳුවතී සමරසේකර විවාහයට පෙර ජයවික්‍රම සහ දුනුවිලගේ අනුර ජයවික්‍රම යන අයවලුන් විසින් පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් මිලියන දෙකකුත් පන් ලක්ෂ අසූඅටදහස් තුන්සිය තිස් හතරක් සහ සත පනස් නවයක (රු.25,88,334.59) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

